**ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය - 2021**

**-------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

--------------------

**1.1 තත්ත්වාගණනය කළ මතය**

-------------------------------

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-----------------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

------------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය අඛණ්ඩව පවත්වාගෙනයාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත.වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී. ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සම්පූර්ණයෙන් ක්ෂය කර ඇති දැනට භාවිතා කරනු ලබන පිරිවැය රු. මිලියන 486.8 ක් වූ වත්කම් වර්ග 04 ක ඵලදායි ජීවිත කාලය නැවත සමාලෝචනය කර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරි මූල්‍ය වර්ෂ වලදී භාවිතයට ගතහැකි වත්කම් නැවත අගය කිරීමටත් භාවිතයට ගත නොහැකි වත්කම් අපහරණය කිරීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 38.98 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. මිලියන 66.72 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. මිලියන 27.74 ක වර්ධනයක් නිරීක්ෂණය විය. පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ වියදම් පහළ යෑම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2010 වර්ෂයේ සිට මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල රු.මිලියන 1,034.4 ක් වැයකර කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට අයත් ඉඩමක ඉදිකර තිබුණද එම ඉඩමේ නීත්‍යානුකූල අයිතිය ලබාගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි. | ආපදා කළමනාකරණ අංශය විසින් රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය නමින් ගොඩනැගිල්ල පිහිටි මෙම ඉඩම පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | මෙම ගොඩනැගිල්ල හා එම ඉඩම නීත්‍යානුකූලව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත පවරා ගැනීමට අදාළ කටයුතු කළ යුතු වේ. |
| (ආ) | ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් පිළියෙල කර අවසන් කර නොතිබුණු අතර මානව සම්පත් ප්‍රතිපත්ති සකස් කිරීමේ කටයුතු 2022 මාර්තු 30 දින වන විටත් අවසන් කර නොතිබුණි. | සැලසුම් කිහිපයක් සකස් කර ඇති අතර වඩාත් යෝග්‍ය සැලසුම සෙන්දායි ක්‍රියාකාරී රාමුවට සහ අනෙකුත් ආපදා අවදානම් අවම කිරීමේ සම්මුතීන්ට අනුගතව සකස් කරන ලද සැලැස්ම ඉදිරියේදී ඉදිරිපත් කිරීමට කටයුතු සංවිධානය කර ඇත. | ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම සහ මානව සම්පත් ප්‍රතිපත්ති ඉක්මනින් පිළියෙල කළ යුතුය. |
| (ඇ) | 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යවසන කළමනාකරණ පනත සංශෝධන කිරීමට 2008 වර්ෂයේ සිට සිදු කර තිබුණු නමුත් 2021 දෙසැම්බර් 31 දින වන තෙක් අදාල සංශෝධන පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | 2005 අංක දරන ශ්‍රී ලංකා ව්‍යවසන කළමනාකරණ පනත සංශෝධන කිරීම ආපදා කළමනාකරණ අංශය විසින් කරන ලද කාර්යයක් බව කාරුණිකව දන්වා සිටිමි. | පනතෙහි සංශෝධන සිදු කර පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගත යුතුය. |

## 3.2 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු. මිලියන 11.8ක් වටිනා ක්ෂේත්‍ර හකුලන ඇඳන් ප්‍රසම්පාදනය කිරීම පරික්ෂාවට අනුව ඇඳන් 1000කින් ඇඳන් 552ක් සැපයීමට දින 83ක් ප්‍රමාද වී තිබුණු නමුත් ගිවිසුම් ප්‍රකාරව ප්‍රමාද දඩ මුදල් අයකිරීමට කටයුතු කර නොතිබුණි. | ඉතිරි ඇඳන් 448 සැපයීම ප්‍රමාදවීම වෙනුවෙන් යම් ප්‍රමාද ගාස්තුවක් අයකර ඉතිරි මුදල ගෙවීමට ප්‍රසම්පාදන කමිටුව තීරණය කර අදාළ කටයුතු සිදු කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට අනුගත විය යුතුය. |

## 3.3 කාර්යය මණ්ඩල පරිපාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට සංවිධානයේ අනුමත කාර්යය මණ්ඩල නිලධාරින් 465 ක් වුව ද, සේවයේ නියුතු කාර්යය මණ්ඩලය 302 ක් වූ බැවින් පුරප්පාඩු 163 ක් තිබූ බව අනාවරණය විය. මෙම පුරප්පාඩුවලින් ද්විතීයික මට්ටමේ පුරප්පාඩු 134 ක් වූ අතර ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 25 ක්ද, තෘතියික මට්ටමේ පුරප්පාඩු 04 ක්ද විය. | 2021.12.31 දින වන විට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අනුමත කාර්යය මණ්ඩලය 465ක් වූ අතර, සේවයේ නියුතු කාර්යය මණ්ඩලය 302 ක්ද, පුරප්පාඩු 163ක් වේ. | කාර්යය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට කටයුතු කල යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ක්‍රියාකාරී සැලැස්ම අනුව ආයතනය විසින් නායයෑම් ව්‍යාපෘති සඳහා රු.මිලියන 350ක් ලැබී තිබුණු අතර මූල්‍ය ප්‍රගතිය රු.මිලියන 139.29 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව ප්‍රතිපාදන වලින් සියයට 50 කට අඩු ප්‍රමාණයක් වියදම් කර තිබියදී ව්‍යාපෘතියෙහි භෞතික ප්‍රගතිය සියයට 75 ක් ලෙස ප්‍රමාණවත් ඇගයීමකින් තොරව දක්වා තිබුණි. | ඇස්තමේන්තුවල පැවැති ගැටළු අනුව ව්‍යාපෘති සැලසුම් කරන ලද පරිදි ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම නිසා 72% භෞතික ප්‍රගතියක් අත් කර ගෙන ඇත. | ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කළ යුතුය |
| (ආ) | සමාලෝචිත වර්ෂවල බහුවිධ උපක්‍රම අවදානම් තක්සේරුව සඳහා වෙන් කර තිබූ රු.මිලියන 10ක් උපයෝගි කරගෙන ව්‍යාපෘති 11ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. නමුත් මෙම ව්‍යාපෘතිවල අපේක්ෂා කර තිබූ ක්‍රියාකාරකම් නිසි ලෙස ඉටු නොකිරීම නිසා අපේක්ෂිත අරමුණු කරා ළඟා වීමට නොහැකි වී තිබුණි. | එම ව්‍යාපෘති ආරම්භ කිරීමේ මූලික කටයුතු ක්ෂේත්‍රයේ සිදුකල යුතු ඒවා බැවින් රටෙහි පැවති වසංගත තත්වය මත ඒවා ආරම්භ කිරීමට නොහැකි විය. | ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ක්‍රියාකාරි සැලැස්ම අනුව, පුහුණු අංශය මගින් රු.මිලියන 25ක් වැය කර පුහුණු වැඩසටහන් 557ක් සැලසුම් කර තිබුණද ඉන් පුහුණු වැඩසටහන් 197ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි. එම නිසා වෙන්කල වියදමේ ඉතිරිය නැවත අමාත්‍යාංශය වෙත ප්‍රතිපූර්ණය කිරීමට සිදුවී තිබුණි. | ජන සහභාගිත්වයෙන් පුහුණු හා දැනුවත් කිරිමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරිමට නොහැකිවීම නිසා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අන්තර් කාලීන කළමනාකරණ කමිටුවේ අනුමැතියට යටත්ව රුපියල් මිලියන 15 ක් ව්‍යුහාත්මක ආපදා අවදානම් අවම කිරිමේ කටයුතු සඳහා 2021.08.10 දින ලබාදෙන ලදි. නමුත් පැවති තත්ත්වය හමුවේ එම ව්‍යුහාත්මක අවම කිරිමේ ව්‍යාපෘතිද ක්‍රියාත්මක කිරිමට නොහැකි වී ඇත. | ක්රියාකාරි සැලැස්මට අනුව කටයුතු කළ යුතුය. |